## 1. ශීර්ෂය 1 - අතිගරු ජනාධිපතිතුමා

----------------------------------

### 1.1 විගණන විෂය පථය

---------------------

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 21 දින ජනාධිපති ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.993,236,379 ක් වූ අතර, එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 95 සිට සියයට 98 ක් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ට වැඩි කාලයක සිට පැවත එන රු.37,480,220 ක තැන්පත් ගිණුමේ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### (ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂයය අංක 00101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.958,928 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 1.4 අනුකූල නොවීම්

### නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථාවක් විග්‍රහ කර පහත දැක්වේ.

මුදල් රෙගුලාසි 94 ප්‍රකාර ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම සිදු නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 කට හා මූලධන වැය විෂයයන් 05 කට අදාලව ඉතිරියේ එකතුව රු.356,994,014 ක් ඉක්මවා රු.401,402,702 කින් බැරකම්වලට බැඳී තිබුණි.

**1.5 පාඩු හා හානි**

---------------

නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාහන 12 කට සිදුවූ රිය අනතුරු සඳහා රක්ෂණ වන්දි ලැබීමෙන් පසු තවදුරටත් අයකර ගතයුතු හෝ කපාහල යුතු බවට හානි හා පාඩු ලේඛනයේ සටහන් කර තිබූ රු.3,715,594 ක් විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂය තුලදී වාහන 24 කට සිදු වූ රිය අනතුරු සඳහා රක්ෂණ වන්දි ලැබීම් විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණි.

**1.6 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | | 2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික | | |
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 162 | 45 | 226 | 11 | 64 |
| (ආ) තෘතීයික මට්ටම | 23 | 95 | 16 | 128 | 07 | 33 |
| (ඇ) ද්විතියික මට්ටම | 326 | 80 | 258 | 104 | 68 | 24 |
| (ඇ) ප්‍රාථමික මට්ටම | 603 | 142 | 475 | 168 | 128 | 26 |
| එකතුව | 1008 | 479 | 794 | 626 | 214 | 147 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ස්ථිර තනතුරුවල 214 ක් පුරප්පාඩු පැවති අතර තාවකාලික තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාව 147 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.